නෙත FM

5 පහේ පන්තිය

★ **අංක 01 සිට 30 තෙක් එක් එක් ප්‍රශ්නයට සුදුසු පිළිතුර දී ඇති පිළිතුරු අතරින් තෝරා යටින් ඉරක් අඳින්න.**

01 ආදර්ශ පාඨයක් නොවන්නේ,

(1) සතුන්ට හිංසා නොකරමු.

(2) ජාතික ගීයට ගරු නොකරමු.

(3) පරිසරය විනාශ නොකරමු.

02 සූර්ය නමස්කාරයේ දෙවන අවස්ථාව කුමක් ද?

(1) දෑත් ඉහළට ඔසවා පසුපසට නැවීම

(2) ශරීරය ඉදිරියට නවා දෑතින් දෙපා ඇල්ලීම

(3) ශරීරය පොළොවට සමාන්තර වන සේ බිම දිගා වීම

03 රාජ්‍ය ලාංඡනයේ ඇති සංකේත ගණන කීය ද?

(1) 6 (2) 7 (3) 8

04 ශ්‍රී ලංකාවේ ජාතික ක්‍රීඩාව කරනු ලබන අවස්ථාවක පිටියේ සිටින ක්‍රීඩකයන් ගණන කීය ද?

(1) 6 (2) 12 (3) 14

05 මල් සහ ගෙඩි යන දෙවර්ගය ම ඖෂධීය පානයක් ලෙස යොදා ගත හැකි ශාකය වන්නේ,

(1) රණවරා (2) පොල්පලා (3) බෙලි

06 ''ගජමන් නෝනා'' කිවිඳිය කවි ලියා ඇත්තේ පහත සඳහන් කුමන ශාකය පිළිබඳව ද?

(1) දෙනිපිටියේ නුග රුක

(2) ඕපනායක යෝධ පුස්වැල

(3) තිස්සමහාරාම චෛත්‍ය අසල පිහිටි කොහොඹ ගස

07 පහත සඳහන් සතුන් අතරින් කිසියම් ලක්ෂණයක් අනුව වෙනස් සතා තෝරන්න.



(1)



(2)



(3)

08 පස්ගෝරස ලබා දෙයි.


(1) මුවා (2) ඇතා (3) එළදෙන

09 පොදු බස් රථයක ගමන් කිරීමේ දී අප විසින් නොකළ යුතු හැසිරීමකි.

(1) පා පුවරුවේ ගමන් කිරීම (2) පිටතට යම් යම් දේ විසි නොකිරීම

(3) ප්‍රවේශ පත්‍රයක් ලබා ගැනීම

10 මෙම රූපයෙන් දැක්වෙන්නේ,



(1) බ්ලැන්කට් මැස්ම

(2) දම්වැල් මැස්ම

(3) කතිර මැස්ම

11 ගුල්ලන් සහ පණුවන් වැනි සතුන්ගෙන් ආහාරවලට හානි සිදුවන්නේ,

(1) පාරිසරික හේතු නිසා

(2) මිනිස් ක්‍රියාකාරකම් නිසා

(3) නිවැරදි ව ඇසුරුම් නොකිරීම නිසා

12 භාජනයෙහි පියන නොවසා තම්බා ගනු ලබන ආහාරයකි.

(1) දෙල් (2) මඤ්ඤොක්කා (3) අර්තාපල්

13 විදුලි සැර වැදුණු විට වහා කළ යුතු දෙයකි.

(1) ප්‍රධාන ස්විචය විසන්ධි කිරීම.


(2) අසල්වැසියන්ට කතා කිරීම.

(3) විදුලිබල මණ්ඩලයට දුරකථන ඇමතුමක් ලබා දීම.

14 දෑස් ආවරණයක් අවශ්‍ය ම පුද්ගලයා වන්නේ,

(1) පෑස්සුම්කරුවා (2) කම්මල්කරුවා (3) කුඹල්කරුවා

15



මෙම මාර්ග සංඥාවෙන් අදහස් වන්නේ,

(1) අනිවාර්ය වට රවුම

(2) වටරවුමෙහි හැරවීම තහනම්

(3) වාහන නැවැත්වීම තහනම්

16 පොදු වාහනයක ආසන වෙන් කොට ඇති පිරිස පමණක් ඇතුළත් පිළිතුර කුමක් ද?

(1) පූජ්‍ය පක්ෂය, රණවිරුවන්, ආබාධිතයින්

(2) ගැබිණි මාතාවන්, ආබාධිතයන්, පූජ්‍ය පක්ෂය

(3) ආබාධිතයින්, ළදරුවන්, ගැබිණි මාතාවන්

17 දණ්ඩ චුම්බකයක ඇද ගැනීමේ (ආකර්ෂණ) ශක්තිය වැඩි වශයෙන් ම ඇත්තේ,

(1) දාරවල ය. (2) දෙකෙළවර ය. (3) මැද කොටසේ ය.

18 'මිනිසා සුවඳයි මල සේ' ගීතය ගායනා කරනු ලබන්නේ,

(1) එඩ්වඩ් ජයකොඩි මහතා

(2) වික්ටර් රත්නායක මහතා

(3) සුනිල් එදිරිසිංහ මහතා

19 බදුල්ල සහ මාතලේ යන දිස්ත්‍රික්ක දෙක අයත් පළාත් දෙක පිළිවෙළින් දැක්වෙන පිළිතුර කුමක් ද?

(1) ඌව සහ මධ්‍යම

(2) සබරගමුව සහ උතුරු මැද

(3) වයඹ සහ දකුණ

20 සුනාමියක් ඇති වීම සඳහා ප්‍රධාන වශයෙන් ම බලපානු ලබන්නේ,

(1) වර්ෂාව අධික වීමෙන් මුහුදේ ජලය වැඩි වීම

(2) අධික සූර්ය රශ්මිය නිසා මුහුදු ජලය උණුසුම් වීම

(3) මුහුදු පතුලේ භූමි කම්පාවක් ඇති වීම

21 භාරතයේ උපත ලැබුවේ නම් දේවත්වයෙන් පුදන බව ඉන්දියානු නියෝජිත 'එම්.එස්.අනේ' මහතා පවසා ඇත්තේ,

(1) එස්. මහින්ද හිමියන් පිළිබඳව

(2) සී.ඩබ්ලිව්.ඩබ්ලිව්. කන්නන්ගර මහතා පිළිබඳව

(3) ඩී.එස්. සේනානායක මහතා පිළිබඳව

22



රූපයෙන් දැක්වෙන්නේ,

(1) ආනන්ද කුමාරස්වාමි මහතා

(2) එස්.ඩබ්ලිව්.ආර්.ඩී. බණ්ඩාරනායක මහතා

(3) ඩී.එස්. සේනානායක මහතා

23 සන්නිවේදනයක් සිදුවීමට අත්‍යවශ්‍ය අංග ගණන කීය ද?

(1) 5 (2) 4 (3) 3

24 නිදහස් ශ්‍රී ලංකාවේ ප්‍රථම අගමැතිතුමා වන්නේ,

(1) එස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක මැතිතුමා

(2) ඩී. එස්. සේනානායක මැතිතුමා

(3) මහින්ද රාජපක්ෂ මැතිතුමා

25 සරම්ප රෝගය බෝ වන්නේ,

(1) කෘමි සතුන් දෂ්ට කිරීමෙන් (2) අපිරිසිදු ජලය පානය කිරීමෙන්

(3) රෝග වාහක පුද්ගලයෙක් මගින්

26 සුනිල් ශාන්ත ගායන ශිල්පියා විසින් ගායනා කළ ගීතයක් වන්නේ,

(1) ලංකා ලංකා පෙම්බර ලංකා.... (2) හෙළ ජාතික අභිමානේ.... (3) රත්නදීප ජන්ම භූමි....


27 අනාරක්ෂිත ස්ථානයක් වන්නේ,

(1) දුම්රිය මාර්ගයේ ගමන් කිරීම (2) රතිඤ්ඤා පත්තු කිරීම

(3) සර්පයන් සහිත තුඹසක්

28 ජාතික අභිමානය දැක්වීම සඳහා ජාතික කොඩියෙහි යොදා ඇති වර්ණය කුමක් ද?

(1) කහ (2) රතු (3) තැඹිලි

29 

රූපයෙහි දැක්වෙන ලී කැබැල්ලෙහි මැදින් ඇති සිදුර කපා ගැනීම සඳහා යොදා ගන්නා උපකරණය වන්නේ,

(1) නියන (2) බුරුමය (3) වරක්කලය

30 හෘද රෝග ඇති වීමට බොහෝ විට බලපානුයේ,

(1) පැණි රස අධික ආහාර ගැනීම (2) ඇඹුල් රස අධික ආහාර ගැනීම

(3) තෙල් අධික ආහාර ගැනීම